# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 ජුනි මස 05 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණීසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

01. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප/VI/(1)/18/19)

(අ) (i) මතුගම අධ්‍යාපන කලාපයේ වර්ෂ 2017 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එයින් ජාතික පාසල් වල ළමුන් සංඛ්‍යාව හා පළාත් පාසල් වල ළමුන් සංඛ්‍යාව වෙන වෙනම කොපමණද?

(ආ) (i) මෙම විභාගයට පෙනී සිටි ළමුන්ගෙන් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(ii) එයින් ජාතික පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(iii) එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශකාත්මකව කොපමණද?

(iv) මෙය පළාත් පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(v) එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

(ඇ) (i) මෙම විභාගයේ දී ගණිත විෂය පමණක් අසමත් මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එය ජාතික පාසල් මට්ටමින් කොපමණද?

(iii) එය පළාත් පාසල් මට්ටමින් කොපමණද?

(iv) ජාතික පාසල් හා පළාත් පාසල් මට්ටමින් ප්‍රතිශතාත්මකව කොපමණද?

02. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/20)

(අ) (i) හොරණ අධ්‍යාපන කලාපයේ වර්ෂ 2017 අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටි මුළු ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ii) එයින් ජාතික පාසල් වල ළමුන් සංඛ්‍යාව හා පළාත් පාසල් වල ළමුන් සංඛ්‍යාව වෙන වෙනම කොපමණද?

(ආ) (i) මෙම විභාගයට පෙනී සිටි ළමුන්ගෙන් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(ii) එයින් ජාතික පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(iii) එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

(iv) මෙය පළාත් පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?

(v) එම සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

(ඇ) (i) මෙම විභාගයේ දී ගණිත විෂය පමණක් අසමත් මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එය ජාතික පාසල් මට්ටමින් කොපමණද?

(iii) එය පළාත් පාසල් මට්ටමින් කොපමණද?

(iv) ජාතික පාසල් හා පළාත් පාසල් මට්ටමින් ප්‍රතිශතාත්මකව කොපමණද?

03. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ඉ/VI/(1)/18/21)

(අ) (i) බස්නාහිර පළාත තුල 2015 හා 2016 වර්ෂ වල පැවති සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

(ii) එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

(ආ) (i) බස්නාහිර පළාත තුල 2015 හා 2016 වර්ෂ වල පුරන්ව පැවති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

(ii) එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

(ඇ) (i) බස්නාහිර පළාත තුල 2015 හා 2016 වර්ෂ වල වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

(ii) එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

04. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/VI/(1)/18/22)

(අ) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරපෙ සිට හීන්කෙන්ද දක්වා දිවෙන මාර්ගයේ පළමු පාලම අලුතින් ඉදිකිරීම සඳහා කොපමණ මුදලක් වෙන් කළේද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකී පාලමේ සැලසුමට අනුව පැති බැම්මේ දිග කොපමණද යන්නත්? සකස් කරන ලද්දේ කොපමණ දිගකින්ද යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට එකී ව්‍යාපෘතිය නිම කර අවුරුද්දක් යන්නටත් පෙර පාලම ඉරි තැලී ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ඇ) මේ වන විට එකී පාලම දෙපස වලවල් හැරී ඇති බැවින් ඒ හරහා ගමන් කිරීමේ දී ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ඉ) එසේ සාර්ථකව එම ව්‍යාපෘතිය නිම නොකිරීම සම්බන්ධයෙන් අදාළ අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

(ඊ) නොඑසේ නම් ඒ මන් ද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා :

"රට තුළ වෙසෙන වැඩ කරන ජනතාව ඇතුළුව මුළු මහත් ජනතාව මුහුණ දෙන ජීවන වියදම දරා ගන්නේ කෙසේද යන ගැටලුවට තවත් බරක් ලෙස ඩීසල්, පෙට්‍රල් හා භූමිතෙල් මිල වැඩි වීමත්, ගෑස් මිල වැඩි වීමත් පිළිබඳව වගකිව යුතු පාලකයන් විසින් විශේෂ අවධානයට යොමු කළ යුතුය. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීමත් සමඟින් ද බැඳී ඇති මෙම තත්ත්වය නිසා දරිද්‍රතා මට්ටම තවත් ඉහළ යමින් පවතී. නිෂ්පාදන ආර්ථිකය බිඳවැටීම, අපනයන ආදායම අඩු වීම, ණය බදු හා දඩ මත යැපෙන රටක් බවට පත් කිරීම, වංචා දූෂණ තත්ත්වයන්, රැකියා වියුක්තිය මෙන් ම රැකියා අවස්ථා පිළිබඳව සමාජ ආකල්පයන් ද සමඟ බැඳී ඇති මෙම

තත්ත්වයට පැවැති සහ පවතින පාලනය වගකිව යුතු අතර, ජනතාව මත බර පැටවීම වෙනුවට නාස්තියෙන් තොර පාලනයකට යොමු වන ලෙසත්, වහාම තෙල් හා ගෑස් මිල අඩු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටියි."

(යෝ/8.110/vi (i)/18/02)

[2018.05.22 දින පැවැති සභා රැස්වීමේ වැඩ කටයුතු හා සම්බන්ධිතයි.]

02. ගරු අශෝක රන්වල මන්ත්‍රීතුමා :

"කැළණි ගඟ මධ්‍යම කඳුකරයෙන් ආරම්භව බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයට ප්‍රවිෂ්ටව කොළඹ ගම්පහ දිස්ත්‍රික්ක මැදි කරමින් මුහුද කරා ඇදෙද්දී කොළම ගම්පහ දිස්ත්‍රික්ක තුලදී ඉතා දැඩි දූෂණකරණයට ලක්වීම සිදුවේ. ඉතා විෂ රසායනික ද්‍රව්‍ය, ඩයි වර්ග, දූෂ්‍යකාරක රසායනික මුසු වීම තුල මෙම ඛේදවාචකය සිදු වීම ඉතා බරපතල පාරිසරික හා සෞඛ්‍ය ගැටළු රාශියක් මතු කරයි. කොළඹ නගරය ඇතුළු තදාසන්න ප්‍රදේශ ගණනාවක ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වන්නේද කැළණි නදියයි. දූෂණකරණයට ලක්ව ඇති මෙම පානීය ජල මූලාශ්‍රය සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව සහ පාරිසරික වශයෙන් ජෛව විවිධත්වයට වැදගත් මෙහෙවරක් ඉටු කරනු ලබන පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ තුලින් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහාත් මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් සභාවේ පරිසර අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, කර්මාන්ත දෙපාර්තමේන්තුව, සංචාරක අමාත්‍යාංශය යන ආයතන ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

(යෝ/ vi (i)/18/01)

03. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:

"වර්තමානයේ වැඩිහිටියන්ගේ සිට කුඩා ළමයා දක්වා බෝ නොවන රෝග වලින් පෙළෙන අතර එකී රෝග සීඝ්‍රයෙන් වැඩිවීමේ ප්‍රවණතාවක් ඇත. මෙම තත්ත්වය දිගින් දිගටම වර්ධනය වීමට හේතු ලෙස රසායනික ද්‍රව්‍ය අඩංගු ආහාරපාන භාවිතය සහ තාක්ෂණික මෙවලම් භාවිතයට හුරුවීම නිසා මිනිස් සිරුරට ව්‍යායාම් අඩුවීමද හඳුනා ගෙන ඇත. මෙරටේ අනාගතය භාර ගැනීමට සිටින ළමා පරපුර මෙම උපද්‍රවයෙන් බේරා ගැනීමට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව පාසැල් මට්ටමින් වැඩ පිළිවෙලක් දියත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/ vi (i)/18/02)

XI . සභාව කල් තැබීම.

කේ.එච්.බී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.05.23 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පලාත් සභාව,
5 වන මහල - B පර්යන්තය,
සෙත්සිරිපාය.
බත්තරමුල්ල.